**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு

Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/08/01-චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2026.03.11 |

# සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2026 /02

**පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්,**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම.</u>**

ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම සම්බන්ධයෙන් 2026.03.09 වන දින පැවති ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල පත්‍රිකා අංක 2026/147/02 මඟින් ලබාදුන් උපදෙස් හා අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති හා ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ඒ ඒ අනුමත කාර්යන් සඳහා වැය දැරීමේදි බලය දීම, අනුමත කිරිම, සහතික කිරිම සහ ගෙවීම යන මූලික ක්‍රියාවන් සිදුකල යුතු අතර එය පදනම් කර ගනිමින් බලතල පැවරීම සිදු කිරීමට මේ තුලින් අපේක්ෂා කෙරේ.

1.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති හා ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් අදාල වියදම් දැරීමේ දී සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.

1.2. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් ඒ සඳහා වලංගු වන්නේය.

1.3. මූල්‍ය බලතල පැවරීමේදී බලතල පවරන යම් නිළධාරියකුට එම බලතල සීමාවන් නොඉක්මවන පරිදි තම නිළධාරියකුට යම් විෂයක් වෙනුවෙන් බලතල පැවරිය හැකි වේ. එහෙත් එමගින් බලතල පවරනු ලබන නිළධාරියා ලෙස තමා එම වගකීමෙන් නිදහස් නොවනු ඇති බැවින් මෙම උපදෙස් නිසි ලෙස අනුගමනය කිරීම සියළු දෙනාගේ සාමූහික වගකීමක් වේ.

1.4 සමෘද්ධි බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ඇප මුදල් තැන්පත් කිරිම.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 7/2019 අනුව මුදල් රෙගුලාසි අංක 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල් , ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරිම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවැරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරින් රජයේ ගිණුම්වලට අදාල වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන නිලධාරින් ද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරනු ලබන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුය.

රජයේ නිලධාරින් ගෙන් ඇප අයකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නිකුත් කර ඇති 1999.04.09 දිනැති චක්‍රලේඛ අංක 1/99 හි සඳහන් ඇප මුදල් අදාල කර ගනිමින් 2021.02.25 දිනැති 2021/01 අංක දරණ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම් කර ගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල සේවය කරන සමෘද්ධි කළමණාකරුවන්,සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා සංවර්ධන නිලධාරින් යන කාර්යය මණ්ඩලයෙන් ඇප සුරකුම් ලබා ගැනිම සඳහා 2025/141/03 අංක දරණ මාණ්ඩලික පත්‍රිකාව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |

ඒ අනුව සමෘද්ධි බැංකු හා බැංකු සමිති කාර්යය මණ්ඩලය සඳහා ඇප මුදල් තැන්පත් කිරිම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2026.03.11 දින නිකුත් කර ඇති DSD/HO/02/AD/05/රා.නි. ඇප අංක දරණ චක්‍රලේඛයේ නියමයන් අනුව සියළුම සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවලට අනුයුක්තව සේවය කරන සමෘද්ධි කළමණාකරුවන් සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා සංවර්ධන නිලධාරින් ඇප මුදල් තැන්පත් කිරිමට පියවර ගත යුතුවේ.

**02. <u>ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් මෙහෙයවන නිල බැංකු ගිණුම්</u>**

**2017 අංක 02 දරණ දිවිනැගුම සංශෝධිත පනතහි VI වන කොටසේ 25 (1) වගන්තියේ විධිවිධාන හා vii වන කොටසේ 29(1) වගන්තියේ විධිවිධාන අනුව ස්ථාපිත කර ඇති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මෙහෙයවීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සිදුකරනු ලබයි. එම කටයුතු සිදුකිරීම සඳහා ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන නිල බැංකු ගිණුම් මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවැරෙන නිලධාරින් පිළිබඳ විස්තර පහත දැක්වේ.**

1. ක්ෂුද්‍ර මූල්‍ය අංශය

| ආයතනික මට්ටම | ගිණුමේ නම | ගිණුම ආරම්භ කිරිමේ අරමුණ | ගිණුම මෙහෙයවීමේ නිලධාරියා | ගිණුම ක්‍රියාත්මක කිරිමේ නිලධාරින් |
|---|---|---|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය අංශය | ක්ෂුද්‍ර මූල්‍ය අංශය - ආයෝජන ගිණුම | විවිධ කාර්යයන් සඳහා පිහිටුවනු ලබන ගිණුම් වල අතිරික්ත මුදල් රාජ්‍ය බැංකුවල ඉහල පොලී අනුපාතයක් යටතේ ආයෝජනය කිරිම පිණිස | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු |
| | සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රිය අරමුදල් ගිණුම | සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවලට අවශ්‍ය මුද්‍රිත ලිපිද්‍රව්‍ය සැපයිම පිණිස | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය ) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු |
| | සමෘද්ධි ප්‍රතිලාභි අනිවාර්ය ඉතිරි කිරිම් අරමුදල් ගිණුම | අනිවාර්ය ඉතිරිකිරිම් සඳහා ලැබෙන මුදල් ආයෝජනය කටයුතු කිරිම හා ප්‍රතිලාභින්ට පොලී ගෙවීම | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු |
| | ක්ෂුද්‍ර මූල්‍ය , පොදු ගිණුම | ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ එදිනෙදා සිදුකරනු ලබන ලැබිම් ගෙවිම් කටයුතු සඳහා භාවිතා කරන ගිණුම | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු/ |
| | පුනරුත්තාපන අරමුදල් ගිණුම ( අතුරුදි මුදල් රක්ෂණ අරමුදල් ගිණුම) | අතුරුදි මුදල්, සේප්පු හා ශාරීරික අනතුරු සඳහා රක්ෂණ වාරික මුදල් ගෙන්වා ගැනීම හා වන්දි ගෙවීම | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු |
| | සේවක ණය | එවකට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුදල් ගිණුම | ස්ථිර කාර්යය මණ්ඩලය සදහා නිවාස ඉදිකිරීම් අලුත් වැඩියා/ ඉඩම් මිලදී ගැනීම් සදහා ණය වැඩසටහන ක්‍රියාත්මක කිරිම | | ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු / විෂය කළමනාකරු |
| | ප්‍රතිමුල්‍ය ණය ගිණුම | සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවලට අවශ්‍ය ප්‍රතිමුල්‍ය ණය පහසුකම් සැපයීම | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්ෂුද්‍ර මූල්‍ය) / ගිණුම් කළමනාකරු/ විෂය කළමනාකරු |

**11 .** සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය

| ආයතනික මට්ටම | ගිණුම ආරම්භ කිරීමේ අරමුණ | ගිණුමේ නම | ගිණුම මෙහෙයවීමේ නිළධාරියා | ගිණුම ක්‍රියාත්මක කිරිමේ නිලධාරියා |
|---|---|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල අතිරික්ත මුදල් ආයෝජනය | සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ජංගම ගිණුම (ආයෝජන) | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති හා බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමනාකරු |
| | සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කටයුතු මෙහෙයවීම/ පරිපාලන කටයුතු / ප්‍රජාව සවිබල ගැන්වීම් කටයුතු | ජංගම ගිණුම - පොදු | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති හා බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමනාකරු |
| | ණය සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ණය සංරක්ෂණ ඉතිරි තැන්පත් ගිණුම | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති හා බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමනාකරු |
| | සමුහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සමුහ සංරක්ෂණ ඉතිරි තැන්පත් ගිණුම | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති හා බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමනාකරු |
| | සමෘද්ධි බැංකු සමිතියේ ආයෝජනය හා බැංකු සමිති මුදල් පරිපාලන කටයුතු | ඉතිරි තැන්පත් ගිණුම(පොදු) | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති හා බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමනාකරු |

**111.** සමෘද්ධි ප්‍රජාමූල බැංකුව

| ආයතනික මට්ටම | ගිණුම ආරම්භ කිරීමේ අරමුණ | ගිණුමේ නම | ගිණුම මෙහෙයවීමේ නිළධාරියා | ගිණුම ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා |
|---|---|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | සමෘද්ධි ප්‍රජාමූල බැංකු කටයුතු මෙහෙය වීම /ණය ලබාදීම/ ප්‍රජාව සවිබල ගැන්වීම/ආයෝජන හා පරිපාලන කටයුතු | සමෘද්ධි ප්‍රජාමූල බැංකුව - ජංගම ගිණුම | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු පාලක මණ්ඩල සභාපති / උප සභාපති හා බැංකු කළමනාකරු/ සහකාර කළමනාකරු |
| | බැංකුවේ කෙටිකාලීන මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා | සමෘද්ධි ප්‍රජාමූල බැංකු - ඉතිරි තැන්පතු ගිණුම | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු පාලක මණ්ඩල සභාපති / උප සභාපති හා බැංකු කළමනාකරු/ සහකාර කළමනාකරු |

දැනට ලබා දී ඇති උපදෙස් පරිදි බැංකු සමිති ආයෝජන කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා රාජ්‍ය බැංකු වල ජංගම ගිණුම් හා ඉතිරි කිරීම් තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා අවසර ලබා දී ඇත.

තවද සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා ජංගම ගිණුම හා ඉතිරිකිරීම් තැන්පතු ගිණුම් රාජ්‍ය බැංකුවල ආරම්භ කර පවත්වාගෙන යෑමට අවසර දී ඇත.

සුවිශේෂී තත්ත්වයකදී පමණක් රාජ්‍ය බැංකු හැර යම් පෞද්ගලික වාණිජ බැංකුවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීම් තැන්පත් ගිණුමක් ආරම්භ කිරීමට අවසර දී ඇති විටක හැර, වෙනත් කිසිදු විටක දී ජංගම ගිණුම් හා ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් පෞද්ගලික වාණිජ බැංකු / සංවර්ධන බැංකු / ඉතිරි කිරීම් බැංකුවල ආරම්භ කිරීමට නොහැක.

දැනට අනුමත රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීම් තැන්පත් ගිණුමක් වෙසා වෙනත් බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට යම් සුවිශේෂී තත්ත්වයකදී අවශ්‍ය නම්, **ඒ සඳහා අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය ) නිර්දේශය සහිතව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පමණක් සිදුවිය යුතුය**

**03.** **දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, සමෘද්ධි බැංකු හා බැංකු සමිති අරමුදල් පදනම් කර ගනිමින් රාජකාරි අවශ්‍යතාවය මත ගමන් වියදම්, නිවාඩු දින වැටුප්, අතටපාඩු දීමනා හා අතිකාල ගෙවීම් කිරීම**

**3.1** අතිකාල, අතට පාඩුදීමනා හා නිවාඩු දින වැටුප් ( බැංකු අරමුදල් තුළින් )

| ආයතනික මට්ටම | තනතුර | ප්‍රතිපාදන මූලාශ්‍රය | මාසික උපරිම සීමාවන් | | |
|---|---|---|---|---|---|
| | | | අතට පාඩු (එක් අයකු සඳහා) | අතිකාල (එක් අයකු සඳහා) | දින වැටුප් (එක්අයකු සඳහා) |
| දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අරමුදල් (භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට අතිරේකව) | - | - | දින 03 |
| | බැංකු විෂය කළමණාකරු MN 7 | | - | - | දින 02 |
| | බැංකු විෂය කළමණාකරු MN 4 | | - | | දින 02 |
| | බැංකු විෂය සමෘද්ධි සංවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි (උපරිම දෙදෙනකු සඳහා පමණි) | | - | | දින 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | කළමණාකරු MN 7 | බැංකු සමිති අරමුදල් | පැය 10 | - | දින 02 |
| | කළමණාකරු MN 4 | | | | |
| | සමිති කාර්යය මණ්ඩලය - 4 ක් සඳහා ( සමෘද්ධි සංවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරී) | | - | 10 | දින 02 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | සමෘද්ධි බැංකු කළමණාකරු MN7 | බැංකු අරමුදලින් | පැය 20 | - | දින 03 |
| | සමෘද්ධි බැංකු කළමණාකරු MN4 | | | | |
| | සමෘද්ධි බැංකු කාර්යය මණ්ඩලය 5 ක් සඳහා ( සමෘද්ධි සංවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරී) | | - | 20 | දින 03 |

3.2 සති අන්ත /රජයේ නිවාඩු දිනවල හා සතියේ රාජකාරී වේලාවට අමතරව රාජකාරී නිරත වීම වෙනුවෙන් ඉහත අතිකාල පැය දීමනාව ලබාගත හැක. තවද සතියේ දිනවල රාජකාරී වේලාවට අමතරව අතිකාල රාජකාරී ඉටුකිරීමේ දී පූර්ව අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.

3.3 සමෘද්ධි බැංකු / බැංකු සමිති නිලධාරීන් සති අන්ත හා රජයේ නිවාඩු දිනවල රාජකාරී නිරත වී, තම තනතුරට අදාල සේවා ගණය අනුව අතිකාල හෝ දින වැටුප් ලබා ගැනීමට නම්, ඊට පෙර පහත තොරතුරු ඉදිරිපත් කර සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය, බැංකු සමිති කළමනාකරුගෙන් හා සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් සමෘද්ධී අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ.

* රාජකාරී ඉටු කරන දින
* රාජකාරියට වාර්තා කරන නිලධාරීන්ගේ නම් හා තනතුරු
* එක් එක් නිලධාරියා ඉටු කිරීමට අපේක්ෂිත රාජකාරි කටයුතු

3.4 අතටපාඩු හා අතිකාල ලබාගැනීමට නම් දිනකට පැය 01 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කළ යුතුය.

3.5(i) සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පැහැර හැරි ණය සමථමූල මණ්ඩලයට/ මූල්‍ය සමථමූල මණ්ඩලයට ඉදිරිපත් කර විභාග කරන/ පරීක්ෂණය කරන අවස්ථා සඳහා බැංකු කළමනාකරු සහභාගි විය යුතුය. ඒ සඳහා දින වැටුප් හෝ අතිකාල ලබා ගැනීමට හිමිකමක් ඇත. නිලධාරියා විසින් දින වැටුප් හෝ අතිකාල ඉල්ලීම සමග සමථමූල මණ්ඩල සභාපති විසින් නිකුත් කරන පැමිණීමේ සහතිකයද ඇමිණිය යුතුය. අවශ්‍යතාවය පරිදි වෙනත් නිලධාරියකු සහභාගි වන විටක එම නිලධාරියාට තම තනතුරට අදාල අතිකාල හෝ දින වැටුප් ලබා ගැනීමට හිමිකම ඇත.

3.5(ii) සමෘද්ධි ප්‍රජාමූල බැංකු හෝ බැංකු සමිති වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා සහාභාගී වන විට, එම නිළධාරියාට සංයුක්ත දීමනාව හා සත්‍ය බස්ගාස්තුව ලබා ගැනීමට හැක.

3.6 සමෘද්ධි බැංකු හා බැංකු සමිති අතිකාල, අතටපාඩු දීමනා ගෙවීම මාසිකව අනිවාර්ය දීමනාවක් ලෙස නොව, සේවා අවශ්‍යතාවය පරිදි ගෙවීම් කළ යුතුය.

3.7 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කාර්ය මණ්ඩලය ලෙස ආයෝජන හා ගිණුම් කටයුතු සඳහා සෘජුව සම්බන්ධවන විෂය ලිපිකරුවන් හා සමිති කළමනාකරුට පමණක් ඉහත ගෙවීම් අදාළ වේ.

3.8 දිස්ත්‍රික් කාර්යාලට අනුයුක්තව බැංකු විෂය කටයුතු සම්බන්ධ රාජකාරි පවරා ඇති සමෘද්ධි කළමණාකරු සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා සංවර්ධන නිලධාරින් ඉහත 3.1 හි සීමාවන්ට යටත්ව රාජකාරි අවශ්‍යතාවය මත ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් අවශ්‍ය මුදල පමණක් ප්‍රතිපූරණය කරගත යුතුය.

## 04. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, කාර්ය මණ්ඩලය ගමන් වියදම් දැරීම.

| තනතුර | ප්‍රතිපාදන මූලාශ්‍රය | එක් අයකුට උපරිම මාසික දීමනාව (රු) |
|---|---|---|
| දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ<br><br>(ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් මාසිකව අතිරේක අනුමත කර ඇති නිවාඩු දින 3 සඳහා දින වැටුප් ලබා නොගන්නා නිලධාරින් සඳහා පමණි) | ක්ෂුද්‍ර මූල්‍යඅංශයේ අරමුදල් | රු. 3000.00 |
| දිස්ත්‍රික් බැංකු විෂය කළමණාකරු | ක්ෂුද්‍ර මූල්‍යඅංශයේ අරමුදල් | රු. 4000.00 |
| දිස්ත්‍රික් බැංකු විෂය සමෘද්ධි සංවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි දෙදෙනෙකු සඳහා | එම | රු. 2000.00 |
| දිස්ත්‍රික් විගණන කළමනාකරු | ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අරමුදල් | රු. 3000.00 |
| සංවර්ධන නිළධාරී(දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන) | | රු. 3000.00 |
| දිස්ත්‍රික් අභ්‍යන්තර විගණන නිළධාරී | | රු. 3000.00 |
| දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ කළමණාකරු | ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අරමුදල් | රු. 8500.00 |
| සංවර්ධන නිළධාරී (දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ) | | රු. 3000.00 |
| දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිළධාරී (සමෘද්ධි සංවර්ධන නිළධාරී) | | රු. 8500.00 |

## 05. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පිහිටුවීම හා කාර්යයන්

2026.01.30 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක 1/2026 හි ඡේද 4.1 හි ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා ඇති ප්‍රසම්පාදන කමිටුව හා ඒ සඳහා දී ඇති මූල්‍ය සීමාව තුළ සමෘද්ධි බැංකු හා බැංකු සමිති වලට <u>අදාල කාර්යාල උපකරණ ඇතුළු භාණ්ඩ හා සේවා මිළදී ගැනීම</u> හා වැඩ සඳහා ප්‍රසම්පාදන තීරණ ලබා ගත යුතුය.

5.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මුද්‍රිත / මුද්‍රිත නොවන ලිපිද්‍රව්‍ය, බැංකු ප්‍රවර්ධන සඳහා භාණ්ඩ මිලට ගැනීම සඳහා සමෘද්ධි බැංකු සමිති මට්ටමින් පහත පරිදි ප්‍රසම්පාදන කමිටුවක් පත්කර ගැනීමට හා මිලදී ගැනීම් සිදුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ප්‍රසම්පාදන කමිටුව</u>

i. විධායක කමිටු සභාපති - සභාපති
ii. සමෘද්ධි බැංකු සමිති කළමනාකරු - ලේකම්
iii. බැංකු කළමනාකරු - සාමාජික
(අදාල කාර්යයට සම්බන්ධිත සමෘද්ධි බැංකුවේ/සුදුසු බැංකු කළමනාකරුවෙකු)
iv. ව්‍යාපෘති කළමනාකරු - සාමාජික
(ව්‍යාපෘති කළමනාකරු නොමැති විට වෙනත් සුදුසු නිලධාරියෙක් )
v. මුලස්ථාන සමෘද්ධි කළමණාකරු - සාමාජික

5.2 මිළ සැදැහුම් ක්‍රමය ( මිළ විමසීමක් කර) යටතේ මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම කළ හැක.මෙම කාර්ය කිරීමේදී රජයේ <u>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2024 හි 2.7 හි උපදෙස්</u> අනුගමනය කළ යුතුය.

5.3 ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා සභාපති, ලේකම් ඇතුළුව <u>අවම වශයෙන් තිදෙනෙකුවත් සහභාගී විය</u> යුතුය.

5.4 එක් එක් ස්ථරවල මිලදිගැනීම් කටයුතු ප්‍රමාදයකින් තොරව කඩිනමින් ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු 01 ක් ස්ථාපිත කිරීම පහත පරිදි වේ.

| ප්‍රසම්පාදන කමිටුව | කමිටු සභාපති | ප්‍රතිපාදන සීමාව රු. |
|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ප්‍රසම්පාදන කමිටුව | විධායක කමිටු සභාපති | 200,000.00 |

**06. ක්ෂුද්‍ර මූල්‍ය බැංකු /බැංකු සමිති අරමුදල් භාවිතා කර වත්කම් මිළදී ගැනීම හා මෙහෙයුම් වියදම් දැරීම**

**<u>6.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මූල්‍ය බලතල විවිධ කාර්යන් සඳහා ලබා දීම</u>**

| වැය විෂය | අනුමත සීමාව (රු.) | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 1 මිලදී ගැනීම් - පරිගණක උපකරණ හා ඊට අදාළ තාක්ෂණික උපකරණ හා යටිතළ පහසුකම් සපයා ගැනීම වසරකට | රු. 800,000/- දක්වා | රු. 800,000/- දක්වා | දිස්ත්‍රික්/ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - විසින් දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු (ප්‍රාදේශීය / දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටු තීරණය මත) | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| | රු.800,000/- ට වැඩි | රු.800,000/- ට වැඩි | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 02.මිලදී ගැනීම් - කාර්යාල උපකරණ සදහා වසරකට | රු. 150,000/- දක්වා | රු. 150,000/- දක්වා | පාලක මණ්ඩල සභාපති / විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| | රු.150,001/- සිට 250,000/- දක්වා | රු.150,001/- සිට 250,000/- දක්වා | ප්‍රාදේශීය ලේකම් | | | |
| | රු. 250,001/- සිට රු.500,000/- දක්වා | රු. 250,001/- සිට රු.500,000/- දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |
| | රු.500,000/- ට වැඩි | රු.500,000/- ට වැඩි | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - අධ්‍යක්ෂ ජනරාල් | | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3.සංග්‍රහ කටයුතු (මසකට උපරිම) | රු.7,000/- | රු.5,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 4.විධායක කමිටු/ පාලක මණ්ඩල සංග්‍රහ සඳහා | රු.6,000/- (එක් රැස්වීම් අවස්ථාවක් සඳහා) | රු.5,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 5. උත්සව වියදම් (බැංකු හා බැංකු සමිති ආශ්‍රිත) (වසරකට එක් අවස්ථාවක් සඳහා) | ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය පරිදි | ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය පරිදි | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති අනුමැතිය/ ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 6.සුළු මිලදී ගැනීම් | මාසයකට රු. 20,000/- උපරිමයකට යටත්ව | මාසයකට . රු.10,000/- උපරිමයකට යටත්ව | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 7.ගොඩනැගිලි කුලී | රු.30000 /- දක්වා | රු.30000 /- දක්වා | දිස්ත්‍රික් ලේකම් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| | රු.30001/- සිට රු.250,000 දක්වා | රු.30001/- ට වැඩි - රු.250,000/- | අධ්‍යක්ෂ ජනරාල් | | | |
| | රු.250,000/- ට වැඩි | රු.250,000/- ට වැඩි | කළමනාකරණ මණ්ඩලය | | | |
| 8.1 කම්කරු/ පිරිසිදු කිරීම් සඳහා/ දිනකට (එක් අයෙකුට) | රු. 1,000/- | රු. 1,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ ආවරණ අනුමැතියට යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8.2 මුරකරු ගාස්තු දිනකට (එක් අයෙකුට) දෛනික කුලී පදනම මත. | රු. 1,000/- | රු. 1,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 9. ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් එක් වරකට රු. 5,000/- (වසරකට උපරිම අවස්ථා හතරක් සඳහා) | රු. 20,000/- | රු. 20,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 10.පාලක මණ්ඩල/ විධායක කමිටු රැස්වීම් දීමනාව (එක් රැස්වීමක් සඳහා) | සභාපති- රු.5,000/- සෙසු සාමාජිකයින්ට රු. 3,000/- බැගින් | සභාපති- රු.5,000/- සෙසු සමාජිකයින්ට රු.3,000/- බැගින් | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 11.පාලක මණ්ඩල / විධායක කමිටු සභාපතිවරුන්,ණය හා බැංකු කටයුතු සඳහා පැමිණීමේ දීමනාව (මාසිකව) | රු. 2,000/- | රු.2,500/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 12.ප්‍රවාහන වියදම් (මාසිකව)බැංකු වෙත පැවරු .රාජකාරි වෙනුවෙන් පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරීම වෙනුවෙන් දරණ ලද වියදම් (අදාළ බිල්පත් සඳහා) | රු.7,500/- | රු.5,000/- | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 13.මුද්දර ගාස්තු | අවශ්‍යතාවය පරිදි | අවශ්‍යතාවය පරිදි | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 14. බදු ගාස්තු/ බැංකු ගාස්තු / ආයතනික බිල්පත් ගාස්තු | අදාල බිල්පතේ සඳහන් පරිදි | අදාල බිල්පතේ සඳහන් පරිදි | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15.1 මුද්‍රිත නොවන බැංකු ලිපිද්‍රව්‍ය වෙළඳපළින් මිලදී ගැනීමට දරණ වියදම (වසරකට) | රු.300,000/- | රු.150,000/- | පාලක මණ්ඩල සභාපති/ බැංකු සමිති විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 15.2 ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා මුද්‍රිත බැංකු ලිපි ද්‍රව්‍ය (චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී ඇති ලිපි ද්‍රව්‍ය සඳහා) | රු.500,000/- දක්වා | රු.500,000/- දක්වා | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| | රු.500,001/- සිට රු.1,000,000 / දක්වා- | රු.500,001/- සිට රු.1,000,000 /- දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |
| | රු.1,000,000 /- ට වැඩි | රු.1,000,000 /- ට වැඩි | අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 16. බැංකු / බැංකු සමිති වාර්ෂික සම්මේලනය | රු. 30,000/- (ප්‍රජාමූල සංවිධාන හා ක්ෂේත්‍ර නිළධාරී ඇගයීමේ කටයුතු හා පරිපාලන වියදම් සඳහා) | රු. 40,000/- හෝ බැංකු 5කට වැඩිනම් රු. 60,000/- (ප්‍රජාමූල සංවිධාන හා නිළධාරී ඇගයීමේ කටයුතු හා පරිපාලන වියදම් සඳහා) | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | අය-වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |

සටහන්:- ඉහත 15.1 හා 15.2 **හිදී** ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මුද්‍රිත බැංකු ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන වලට අනුව කටයුතු කළ යුතුය.

| **වැය විෂය** | **අනුමත සීමාව රු.** | | **බලය ලබාදීම** | **අනුමත කිරිම** | **සහතික කිරීම** | **ගෙවීම්** |
|---|---|---|---|---|---|---|
| | **බැංකුව** | **බැංකු සමිතිය** | | | | |
| 17.නිතිඥ ගාස්තු / ණය ආපසු අයකර ගැනීම .(අදාළ බිල්පත්, ඉල්ලීම් මත අනුමත ගාස්තු) | අවශ්‍යතාව පරිදි | අවශ්‍යතාව පරිදි | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 18.පරිගණක පුහුණු ලාභීන් දීමනා (දිනකට) (අනුමත පුහුණුලාභින් සඳහා) | 1000/- (දිනකට) එක් අයෙකුට | 1000/- (දිනකට) එක් අයෙකුට | | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19. කාර්යය මණ්ඩල පුහුණු හා කුසලතා සංවර්ධනය පුහුණු ගාස්තුව | නිලධාරියාගේ රාජකාරි විෂයට අදාල පුහුණු සඳහා අනුමත මුදල | අදාලපුහුණු ගාස්තු අයකිරිම පරිදි අනුමත මුදල | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකර ණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 20.ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා වර්ෂයකට ලිපිද්‍රව්‍ය ලබාදිම | උපරිම මුදල රු.3,500/- කි. නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය ඉල්ලීම් ලබා ගෙන ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර ලිපිද්‍රව්‍ය පමණක් ලබාදීම . (වැඩබලන සියළු වසම් සඳහා ද ලිපිද්‍රව්‍ය නිකුත් කළ යුතුය) | අදාල නැත. | පාලක මණ්ඩල සභාපති | පාලක මණ්ඩල ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 21.කාර්යාල උපකරණ නඩත්තු හා අලුත්වැඩියා වියදම්<br><br>ගොඩනැගිලි/ ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු හා අළුත්වැඩියා වියදම් | රු50.000/ දක්වා | රු50.000/ දක්වා | පාලක මණ්ඩල සභාපති/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු මෙහිදී රු.25,000/- ට අඩු නඩත්තු හා අළුත්වැඩියා සඳහා ආවරණ අනුමැතියට යටත්ව සිදු කළ යුතු අතර රු.25,000/- වැඩි විටකදී බලය ලබාගත් පසුව අනුමැතිය දිය යුතුය. | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| | රු.50,001/- රු.100000 දක්වා- | රු.50,001/- රු.100000 දක්වා - | ප්‍රාදේශීය ලේකම් | | | |
| | රු.100001- වැඩි රු250,000/- දක්වා | රු.100001- වැඩි රු250,000/- දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |
| | රු.250,001/- වැඩි රු.500,000/- දක්වා | රු.250,001/- වැඩි රු.500,000/- දක්වා | අධ්‍යක්ෂ -ක්ෂුද්‍ර මූල්‍ය | | | |
| | රු.500,001/- වැඩි | රු.500,001/- වැඩි | අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 22.විගණන හා විමර්ශන ගාස්තු | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත | කළමනාකර ණ මණ්ඩලයේ අනුමැතිය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 23.1 පරිගණක මෘදුකාංග සේවා ගාස්තු | 6,481.50+ රජයේ බදු | 4,000+ රජයේ බදු | පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23.2 Mobile App සඳහා | 175+ රජයේ බදු | අදාල නැත. | පාලක මණ්ඩල සභාපති | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 23.3 කෙටි පණිවුඩ සේවා ගාස්තු | රු. 300/- | රු. 300/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 24. බැංකු හා බැංකු සමිති සඳහා Sever පහසුකම් ගාස්තු | රු. 4603.69+ රජයේ බදු | රු. 4603.69 + රජයේ බදු | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 25. රක්ෂණ ගාස්තු (අතුරුදි./ ශාරිරික අනතුරු) | චක්‍රලේඛ උපදෙස් පරිදි | චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 26.පුවත්පත් සහ සඟරා ගාස්තු | රු. 2,000/- (මසකට) | රු. 2,000/- (මසකට) | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 27.බැංකු/ බැංකු සමිති ප්‍රගති සමාලෝචන කටයුතු (එක් රැස්වීමක් සඳහා) | උපරිම රු. 25,000/- | එක් අයෙකු සඳහා රු.500/- උපරිමයකට යටත්ව | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු. | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 28.සමෘද්ධි ප්‍රජාමුල බැංකු හා බැංකු සමිති ලියාපදිංචි ගාස්තු | චක්‍රලේඛ උපදෙස් පරිදි | චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 29.ජල බිල්පත් ගාස්තු විදුලි බිල්පත් ගාස්තු | ජලසම්පාදන /විදුලි බල මණ්ඩලයට මාසික බිල්පත /නිවේදනයේ සඳහන් මුදල. | ජලසම්පාදන /විදුලි බල මණ්ඩලයට මාසිකබිල්පත/නිවේදනයේ සඳහන් මුදල. | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 30.වරිපනම් හා බලපත්‍ර ගාස්තු | පළාත් පාලන ආයතන නිකුත් කරන රිසිට් පතෙහි සඳහන් මුදල | පළාත් පාලන ආයතන නිකුත් කරන රිසිට් පතෙහි සඳහන් මුදල | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 31. 1දුරකථන හා අන්තර්ජාල පහසුකම් ගාස්තු(මසකට) | උපරිම සීමාව රු.10,000/- කි. සීමාව ඉක්මවන විට අදාල බිල්පත් සමග දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරිම | රු.7,500/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 3.2.Mobile App පහසුකම සඳහා | මාසයක් සඳහා රු. 500 (ක්ෂේත්‍ර ගත සමෘද්ධි සංවර්ධන නිලධාරි) | -- | පාලක මණ්ඩලය | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |

| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 32.අතට පාඩු/ අතිකාල දීමනා | උපරිම මසකට පැය 20 චක්‍රලේඛ උපදෙස් පරිදි | උපරිම මසකට පැය 10 චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු / බැංකු සමිති කළමනාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 33.නිවාඩු දින වැටුප් | දින 03 චක්‍රලේඛ උපදෙස් පරිදි | දින 02 චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 34.බාහිර විගණන ගාස්තු | චක්‍රලේඛ උපදෙස් පරිදි පූර්ව අවසරය මත | චක්‍රලේඛ උපදෙස් පරිදි පූර්ව අවසරය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 35.කාර්යාල උපකරණ සේවා ගාස්තු (වසරකට) | අදාල සේවා සපයන ආයතනය ඇති කර ගත් ගිවිසුමකට අනුව | අදාල සේවා සපයන ආයතනය ඇති කර ගත් ගිවිසුමකට අනුව | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 36. ගොඩනැගිලි ඉදි කිරීම් හා සංවර්ධන අළුත්වැඩියා (ප්‍රධාන කාර්යාලයේ නිරික්ෂණය මත) | රු.25,000,000/- දක්වා | රු.25,000,000/- දක්වා | දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව | අධ්‍යක්ෂ ජනරාල් | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| | රු.25,000,000/- ට වැඩි | රු.25,000,000/- ට වැඩි | දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව | බැංකු /බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | | |

6.2 හදිසි, අත්‍යාවශ්‍ය හා දෛනික කටයුතු සඳහා යම් මිලදී ගැනීමක් ,වියදමක් , ගෙවීමක් කිරීමේදී සමෘද්ධි බැංකු /සමිති කළමනාකරු ආවරණ අනුමැතිය මත අදාල කාර්ය/මිලදී ගැනීම සිදුකර පසුව අනුමැතිය සඳහා පාලක මණ්ඩල/ විධායක කමිටුවට ඉදිරිපත්කල යුතුය.

අනිකුත් අවස්ථාවලදී පූර්ණ අනුමැතිය යටතේ සිදු කිරීමට වග බලා ගැනීම වඩාත් සුදුසු වේ.

5.3 අනුමත කිරීම ,සහතික කිරීම, ගෙවීම් කිරීම යන දෑ සිදුකළ බව සනාථ කිරීමට අදාල නිලධාරීන් විසින් මුදල් හර සදහා හෝ ගෙවීම් වවුචර් වල අත්සන් කිරීම සිදු කළ යුතුය.

<u>**භාණ්ඩ හා සේවා මිලදී ගැනීම**</u>

සැපයුම් හා සේවා ඉටු කර ගැනිමේදි මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කළ යුතු අතර වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රසම්පාදන සීමාවන්ද සැලකිල්ලට ගත යුතුය.

යම් අවස්ථාවක එම සීමාවන් ඉක්මවා වියදම් දැරීමට සිදුවන අවස්ථාවල ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

<u>**රජයේ අනුමත ආයතන එකකින් හෝ වියිමත්**</u> පරිදි ආයතන වලින් මිල ගණන් ලබා ගැනීමටත්, ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් මිලදි ගැනිම්/ අදාල කාර්යය ඉටුකර ගැනිමට බලය ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම පනත හා 2017 අංක 02 දරණ සමෘද්ධි සංශෝධිත පනතේ පහත පරිදි සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින් සමස්ථ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පද්ධතියේ මූල්‍ය කටයුතු, බැංකු අධීක්ෂණය හා නියාමනය සිදුකරන බැවින් එම අනුමැතිය යටතේ මෙම සියළු උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කරනු ලබන බව සඳහන් කරමි.

**07.** <u>**ඉහත කාර්යයන් අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙල**</u>

සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති හා මහා සංගමය යටතේ පවතින අරමුදල් කළමනාකරණය කරගනිමින් වාර්ෂික වියදම් ඇස්තමේන්තුගත සීමාවන් තුළ ඒ ඒ විෂයන් සඳහා වැය දැරීමට අදාල පාලක මණ්ඩල/ විධායක කමිටු නිලධාරින්ට අවසර ඇත.

එසේම යම් කාර්යයක් කිරිමට බලය දුන් පමණින් හෝ අනුමත කළ පමණින් අදාල ගෙවීම නොකරන අවස්ථා පැවතිය හැක. ඒ සඳහා අදාල විධිමත් ලේඛන සහතික කිරිමේ නිළධාරියා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවලදී එම ලේඛන සැපයීම විෂයභාර නිළධාරියාගේ වගකීම වේ.

ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ, මහා සංගමයේ හා සමෘද්ධි බැංකු ප්‍රජාමුල හා බැංකු සමිති පද්ධතියේ පවතින අරමුදල් විධිමත් කළමනාකරණයකින් යුතු මූල්‍ය පාලනයක් සහිතව පවත්වාගෙන යා යුතු වේ. සමෘද්ධි බැංකු හා බැංකු සමිති මේ වන විටත් ප්‍රායෝගිකව සමෘද්ධි පනත අනුව ක්‍රියාත්මක වන බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය නියාමනය සහ රජයේ චක්‍රලේඛවලට අනුගත වෙමින් එදිනෙදා රාජකාරී සිදුකිරීම සියළු දෙනාගේ වගකීමක් බව සඳහන් කරමි.

<u>මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අදාළ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ උල්ලංඝනය නොවන ආකාරයට අදාල ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.</u>

ඒ තුළින් මනා මූල්‍ය විනය ආරක්ෂා කරගනිමින් දේශයේ සෞභාග්‍ය කරා ගමන් කරනු ලබන කාර්යය ඉටු කිරීම සඳහා සහයෝගය දැක්වීම ඔබ ඇතුළු අප සැමගේ ජාතික වගකීම හා යුතුකම බවද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ධම්මික මුතුගල
අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)
සභාපති (සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය)

**පිටපත් :-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස./අ.ක.ස.
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
3. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ අංශය - අ.ක.ස.
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
7. ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස./අ.ක.ස.
8. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
9. සභාපති - සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය. - කා.දැ.ස./අ.ක.ස.